රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:248

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1984 අප්‍රේල් මස 24 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙතටයි.

## පදිංචි ස්ථාන අහිමි වූ රජයේ නිලධරයන්/සංස්ථා සේවකයන්

1984 ජනවාරි මස 19 වන දින හා අංක. 236 දරණ රා. පරි. චක්‍රලේඛයේ 1 ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමුකරනු ලැබේ.

02. 1983 දෙසැම්බර් මස 31 වන දිනට පළමුව රාජකාරි සඳහා වාර්තා කර නො රජයේ නිලධරයකු/රාජ්‍ය සංස්ථා සේවකයකු සම්බන්ධයෙන් මෙසේ ක්‍රියා කළයුතුය:-

(අ) 1984 අප්‍රේල් මස 30 වන දිනට පළමුව රාජකාරි සඳහා වාර්තා කිරීමට ඔහුට වහාම නියෝග නිකුත් කළයුතුය;

(ආ) 1984 ජනවාරි මස 01 දින සිට, 1984 අප්‍රේල් මස 30 වන දින හෝ ඊට පළමු දිනයක් හෝ වන්නේ නම් පමණක් රාජකාරි සඳහා වාර්තා කරන දිනය දක්වා වන කාලය වැටුප් රහිත නිවාඩු කාලයක් සේ සැලකිය යුතුය;

(ඇ) 1984 අප්‍රේල් මස 30 වන දින වනවිට, රාජකාරි සඳහා වාර්තා නොකරන රජයේ නිලධරයකුට/සංස්ථා සේවකයකුට තනතුර අත්හැර යාමේ නිවේදනයක් නිකුත් කළයුතුය.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සු/-24